<u>සංකල්ප සටහන</u>

# ශ්‍රී ලංකාවේ ස්ත්‍රිය සහ වැටුප් රහිත සුරැකුම් වැඩ

**කෙටි චිත්‍රපට තේමාවන්** 1. ගෙදර වැඩත් වැඩ
2. වැටුප් නොලබා ස්ත්‍රිය කරන සුරැකුම් වැඩවල වටිනාකම

ශ්‍රී ලංකාවේ මුළු ජනගහණයෙන් ස්ත්‍රීන් 52% කි. එයින්ද 2015 වසර වන විට මිලියන 7ක ජනගහනයක් ගතහොත් එයින් 74.8% ක්ම ආර්ථික වශයෙන් සක්‍රීය දායකත්වය ලබානොදෙන වැඩවල යෙදෙන ස්ත්‍රීන් බව පෙන්වා දෙයි. එයිනුත් ශ්‍රී ලංකා ජන සංඛ්‍යාලේඛන සහ දත්තයන් පෙන්වාදෙන පරිදි මෙරට ආර්ථික ක්‍රියාවලියට ස්ත්‍රීන්ගේ දායකත්වය 36% ක් බව සඳහන් වේ.[1] කෙසේ වෙතත් අක්‍රීය ශ්‍රම දායකත්වය සපයන්නන්ගෙන් 61.4% ක් පමණ ස්ත්‍රීන් "ගේදොර වැඩ කටයුතුවල යෙදෙන්නන්" සහ "ප්‍රජනන ක්‍රියාවලියට දායක වන්නන්" ලෙස හඳුන්වා දී තිබේ.

ශ්‍රම බලකායේ මිනුම් දණ්ඩ අර්ථ දක්වනුයේ කෙනෙකුගේ ශ්‍රමයෙන් රටේ ආර්ථිකයට දායක වීම යනුවෙනි. මුදල්මය අගයක් උත්පාදනය කරන ස්වයං රැකියා, වෙනත් නිවෙසක කරන වැඩ ඇතුළු තවත් බොහෝ වැඩ සඳහා යොදවන ස්ත්‍රී ශ්‍රමය රටේ සංවර්ධනයට ඉවහල් වුවද එය ශ්‍රම බලකායට ඇතුළත් කිරීමට අපගේ සමාජයේ මෙන්ම දේශීය ශ්‍රම බලකාය මනින, ප්‍රතිපත්ති සම්පාදනය කරන ආයතනවල අවධානයට ලක් නොවේ. ලෝකයේ වෙනත් දියුණු රටවල්වල ස්ත්‍රීන් ගේ සුරැකුම් සේවය අගය කිරීමකට ලක්වී ඇත.

මානව යහපැවැත්ම සහ ආර්ථික සංවර්ධනය සඳහා රැකවරණය අත්‍යවශ්‍ය වන අතර, සෑම සමාජයකම පිරිමින්ට වඩා ගෙවීමක් නොමැතිව කාන්තාවන් ඒ වෙනුවෙන් වගකීමක් දරයි. ඈත අතීතයේ සිටම අප සමාජය විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සම්මතයන් යනු ළමයින් රැකබලාගැනීම සහ අධ්‍යාපනය ලබාදීම, පවුලේ වැඩිහිටි සමාජිකයන් රැකබලාගැනීම, රෝගීන් බලාගැනීම, ගෙවතුවගාව, ආහාර පිලියෙළ කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය, ජලය, ඉන්ධන එකතු කිරීම, වැනි සත්කාරක වැඩවලින් බොහෝමයක් කාන්තාවන් සහ ගැහැණු ළමයින් විසින් සිදු කෙරේ. මුදල්මය වටිනාකමන් තොරව කරන එවැනි සියලුම වැඩ සුරැකුම් සේවය(Unpaid Care Work) ලෙස සැලකිය හැක.

අප රටේ ජීවත්වන සෑම ස්ත්‍රියක්ම තමන්ට අයත් ජනවර්ගය, ආගම, පළාත, ජීවත් වන පරිසරය, විවාහක අවිවාහකත්වය, සිටින දරුවන් ගණන, පවුලේ ජීවත් වන සංඛ්‍යාව, ආබාධිත තත්ත්වයේ සිටින පුද්ගලයින්/ළමයින්, ආදායම් මට්ටම, කරන රැකියාව යනාදී තවත් කරුණු රාශියක් මත කරන සුරැකුම් වැඩ ප්‍රමාණයෙන් සහ ස්වභාවයෙන් වෙනස් විය හැක. එබැවින් සුරැකුම් සේවය හඳුනාගැනීමත් ඒ හරහා මුළු මහත් සමාජයේම වෙනසක් කිරීමට ප්‍රතිපත්තිමය වශයෙන් කටයුතු කිරීම ස්ත්‍රීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට ඉවහල් වනු ඇත. ගේදොර වැඩවලට දායකවන සමහර පිරිමින් ද අප පවුල්වල සිටී. ඔවුන්ගේ ඒ කාර්යයන්/කටයුතු බොහෝවිට සමාජයේ අවධානයට හෝ අගය කිරීමකට යොමු වී නැත.

## මෙම කෙටි චිත්‍රපට තරඟය තුළින් අප බලාරොත්තු වන දේ

- යහපත් සමාජයක් ගොඩනැගීම වෙනුවෙන් ස්ත්‍රිය කරන සියලු 'සුරැකුම් වැඩ' වැඩ ලෙස හඳුනාගෙන සමාජ සහ ආර්ථික වටිනාකමක් ලබාදෙන මෙන් සමාජය දැනුවත් කිරීම.
- වැටුප් රහිත සුරැකුම් වැඩ (Unpaid Care Work) සඳහා වටිනාකමක් හිමි කරදීම.
- අප සමාජය තුළ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සම්ප්‍රදායිකව බෙදාගත්තා වූ වැඩ සංස්කෘතියට සීමා නොවූ, වැඩ සමව බෙදා ගැනීම පිළිබඳ පුළුල් කතිකාවතක් ගොඩනැගෙන අයුරින් දෘශ්‍ය මාධ්‍ය භාවිතා කිරීම.

---

[1] ශ්‍රී ලංකා ජනලේඛණ හා සංඛ්‍යාලේඛන දෙපර්තමේන්තුව, 2015